// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1846/16 - 2014 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2014.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

2013 ජුනි මස 05 දිනැති අංක 1813/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝග සහ 2013 නොවැම්බර් මස 21 දිනැති අංක 1837/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝග මෙයින් තවදුරටත් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :—

1A - PG 1926 — 710 (01/2014)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*